සාම්පූර් ගල් අඟුරු බලාගාරේ ව්‍යාපෘතිය නතර කරා නේ!

දැන් ඒ වෙනුවට අපි හදනවා මෙගා වොට් 300 ක ස්වභාවික වායු බලාගාරයක් (පරිසරවේදියෝයි මේකට විරුද්ධව කෑ ගහපු හැමෝම ඉල්ලුවේ මේක නේ)... මේකට බෝඩ් එකක් දානවා "300MW LNG Plant " හැබැයි අපි මේක දුවන්නේ ඩීසල් දාල.... අඩුම ගානේ ඊළඟ අවුරුදු 10 ට වත් ......මොකෝ අපිට කිසිම ඕනෙකමකුත් නැහැ සැලසුමකුත් නැහැ ස්වභාවික වායු භාවිතයට ඕනේ කරන යටිතල පහසුකම් හදන්ඩ... කලින් හදපු කෙරවලපිටියටත් (300MW ) තියෙන්නේ මේ කතාවම තමා .... කවුරුත් කෑ ගැහුවේ නැහැ නේ..... මේකටත් පරිසරවේදියෝ කෑ ගැහුවොත් අපි පෙන්නනවා LNG බෝඩ් එක....

කෙරවලපිටිය හදන unit එකකට Rs. 45.75 ගෙව්වා........... නොරොච්චෝලේ unit එකකට වියදම් වුනේ Rs 7.63.... (මූලාශ්‍රය - PUCSL 2015 Generation Performance)

කවුරු හරි ඇවිත් කෑගහුවොත් ගණන් වැඩි..... Power Mafia කියල අළුත් Plant එකට .... අපි පෙන්නනවා ඒ ගොල්ලොන්ටත් බෝඩ් එක.... මේක LNG වලින් දුවපු දවසට අපි ලාබෙට දුවනවා (වරහන් ඇතුලේ (අපි දන්නෙත් නැහැ කවද්ද එහෙම දුවන්ඩ පුළුවන් දවස….)).......කෙරවලපිටිය යුගදනවී එක අවුරුදු 8 දිව්වේ...තව එකක් දිව්වහම මොකෝ?

6 ගුණයක් වියදම් කරලා ඩීසල් බලාගාරයකින් විදුලිය හදන වෙලාවේ.... ඒ සල්ලි වලින් කොටසක් වියදම් කරලා පරිසර දූෂණය අඩු කරලා දුවන්ඩ පුළුවන් ගල් අඟුරු බලාගාරයක් හදමු කියන පරිසරවේදියෝ අපිට නැහැ.... ඉන්නේ කරන්ඩ යන project එකේ වැරදි පෙන්නලා ඒක නතර කරන අය විතරයි ......අපි පරිසරේ ගැන කතා කරන අය කතා කරන්නේ පරිසරේ ගැන විතරයි…. විදුලිය හදන අය කතා කරන්නේ විදුලිය ගැන විතරයි….. අනික් එක්කෙනා කියන දේ කොහොමත් අහන්නේ නැහැ…. ඉන්දියාවෙන් ගෙන්නලා තමා අපි සාම්පූර් වලටත් පාරිසරික ඇගයීම් වාතර්‍ාව (EIA ) එක හැදුවේ….. ඒක වැරදි නම් ඒක අපේ අවුලක් නෙමෙයි කොහොමත් එතකොට…….ලංකාවේ පරිසරවේදියෝ EIA එක පතුරු ගහද්දි අපි ඒවා ගණන් ගන්නෙම නැහැ….. ඒවාට උත්තර දෙන්නෙත් නැහැ…..නඩු දැම්මොත්? ගල් අඟුරු එක හදන්නේ නැතුව අපි LNG බෝඩ් දාල ඩීසල් plant දුවනවා…… ඒක ඉක්මනට හදන්දත් පුළුවන්…. පරිසරවේදියොත් කට වහන් ඉන්නවා…. නඩුත් නැහැ….

හැබයි කවුරුත් අමතක කරන දේ තමා ස්වභාවික වායු කියන්නෙත් තවත් එක් පොසිල ඉන්ධනයක් (Fossil Fuel ).... ගල් අඟුරු වලට වැඩිය පරිසර දූෂණේ අඩු වුනත් නිසියාකාරව භාවිතා කරේ නැත්තන් මේකෙනුත් විශාල පරිසර දූෂණයක් සිදු වෙන්ඩ පුළුවන් බව….. LNG වල තියෙන ප්‍රධාන සංගටයක මීතේන් (CH 4) වායුව කිලෝ එකක් වායු ගෝලයට මුදා හැරියොත් එකෙන් කාබන් ඩයොක්සයිඩ් කිලෝ 34 මුදා හැරිය හා සමානයි ගෝලීය උණුසුම වැඩි කිරීමට දෙන දායකත්වය……මෙවැනි අනතුරක් සිදුවූ මෑත කාලීන සිදුවීම වන්නේ කැලිෆෝනරීයා හි සිදුවූ ස්වභාවික වායු කාන්දුවෙන් මීතේන් ටොන් 77,000 පරිසයට නිකුත් වීම… මෙම වායුවේ ඇති විෂ සහිත බව නිසා ඒ අවට පවුල් 2500 ඉවත් කරගැනීමට සිදු වුන…

ගල් අඟුරු දහනයේදී 200kg කාබන් ඩයොක්සයිඩ් මුදා හැරෙද්දී එම බලශක්තියම ලබා දෙන්ඩ LNG වලින් නිකුත් වෙන්නේ 117kg …. හැබයි Diesel වලින් කරද්දී 161kg මුදා හැරෙනවා….. ගල් අඟුරු වල දහනයේදී නිකුත් වෙන අහිතකර විෂ ද්‍රව්‍ය පරිසරයට මුදා නොහැර පාලනය කරන්ඩ පුළුවන් තාක්ෂනේ දියුණු වෙලා තියෙනවා ලෝකේ…මොකද ගල් අඟුරු ටික ලිපකට දාල ගිනි තියනවා නෙවෙයි නේ….(Controlled Combustion in a controlled environment with emission control technologies - Not open air burning).. ඒක නේ මෙච්චර දියුණු ජමර්නිය තවමත් විදුලියෙන් 44% ගල් අඟුරු වලින් හදන්නේ…(Source - EIA (International Energy Agency ) ) එහෙ පරිසරවේදියෝ නැද්ද? ඉන්නවා! ලෝකෙම ගත්තොත් තාමත් 40% වැඩියි ගල් අඟුරු විදුලිය නිෂ්පාදනය …

අපි තේරුම් ගන්නේ නැති අනික් කාරණේ තමා පරිසර දූෂණේ නැති කරන්ඩ බැහැ - සුළන්(Wind ) විදුලි බලාගාරයක් හැදුවත් සූයර් ශක්ති (Solar ) බලාගාරයක් හැදුවත්…….. පාරිසරික බලපෑම පාලනය කරන්ඩ/අඩු කරන්ඩ තමා පුළුවන්…..... සාම්පූර් ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීම් වාතර්ාවේ අඩු පාඩු හොයනවා වගේ හෙව්වොත් සුළන් විදුලි බලාගාරයක් හදන එකත් හරිම අමාරු වැඩක්…. ඩීසල් බලාගාරයක් ගැන කතා කරලා වැඩක් නැහැ…. අපේ අවාසනාවට ඩීසල් බලාගාරයක් හදල එකට LNG බෝඩ් එක දැම්මහම කවුරුත් ඒකට විරුද්ධව කථා කරන්නේ නැහැ…. කිසිම පරිසරවෙදියෙක් ඩීසල් බලගාරේ කොහොම දිව්වත් බෝඩ් උස්සන් උද්ගෝෂණයක් කරන්නේ නැහැ…. ඒකෙන් පරිසර දූෂණයක් වෙන්නේ නැද්ද? වෙනවා… හරියට පාලනයක් නැතුව ඩීසල් බලාගරේ දුවල විශාල පරිසර දූෂණයක් සිදු කරන්ඩ පුළුවන් කියලා ඔය උද්ඝෝෂකයෝ දන්නවද? නැත්තන් දැනගෙන කටවහන් ඉන්නවද කියල හිතා ගන්ඩ තමා ටිකක් අමාරු! සැලසුමක් නැතුව හිතුමතේ ඩීසල් වලින් විදුලිය හදද්දී අපේ ආථ්‍රීකේට වෙන පාඩුව ගැන කථා කරන්ඩ ඉන්නේ කීප දෙනයි…. නොරොච්චෝලේ බලාගරේ පරක්කු කරපු එකේ (2004 - 2014) පාඩුව ඩොලර් බිලියන 4 - මෙහෙම කියන්නේ මේ පිළිබඳ මාන දැනුමක් ඇති දෙස් විදෙස් පිළිගත්ත ආචායර් තිලක් සියඹලාපිටිය …. දැන් පවතින විනිමය අනුපාතෙන් බැලුවොත් මේ පාඩුව රුපියල් වලින් බිලියන 585 (මුළු හම්බන්තොට ගුවන්තොටුපොළ හදන්ඩ වියදම් වුනේ මේ සිදුවෙච්ච ආථ්‍රීක පාඩුවෙන් විස්සෙන් එකයි … එහෙමත් නැත්තන් 5%... හරියටම කිව්වොත් ඩොලර් බිලියන දශම දෙකයි )! වරද්දල වටහා ගන්ඩ එපා…. මේ මුදල වියදම් කරේ අලුතෙන් විදුලි බලාගාර හදන්දවත්, අලුතෙන් කමර්ාන්ත ආරම්භ කරලා මිනිස්සුන්ට රස්සා දෙන්ඩ වත් නෙවෙයි…. මුළු ඩොලර් බිලියන 4 ම වියදම් කරේ ඩීසල් වලින් විදුලිය හදන්ඩ ගල් අඟුරු බලාගරේ හදනකන්….

අපි අලුතෙන් හදන බලාගරේ නම ස්වභාවික වායු බලාගරේ …..පොඩි Sustainability ගතියක් නමේ තියෙන හින්ද වැඩිපුර ගානක් (6 ගුණයක් වගේ සුළු ගානක්) ගෙවල කට වහගෙන ඉමු……අපි හැබයි දුවන්නේ ඩීසල් වලින්……. ලස්සන නමක් තියෙන පරිසර හිතකාමී බෝඩ් එක දිහා බලල අපි සැනසෙමු!

සල්ලි??? ඒක ප්‍රශ්නයක් නැහැ…. අනික් එක මෙච්චර ලෝකෙට Renewable ගැන කියල දෙන Germanyය 44% විදුලිය හදන්නේ තාමත් ගල් අඟුරු වලින් (Source - EIA) ….. හා හා… ඒක ගැන කතා කරන්ඩ එපා…..ජමර්නිය 31% විදුලිය හදන්නේ පුනජර්නනීය ශක්තියෙන් නේ (Source - EIA ) ….ඒක විතරයි කතා කරන්නේ….. ජමර්නිය ඔය තත්වෙට ආවේ මොන බලශක්තිය පාවිච්චි කරලද? ඒකත් කතා කරන්ඩ එපා…. ලංකාවේ දැනට පුනජර්නනීය විදුලිය (NCRE )නිෂ්පාදනය 11.2%..(මූලාශ්‍රය - 2015 මහ බැංකු වාතර්ාව).. ඇත්තට? ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ තිබ්බේ 2015 දී 10%ක ඉලක්කයක්…(.මෙහි පුනජර්නනීය ලෙස සඳහන් කොට ඇත්තේ මහා පරිමාණ ජල විදුලි බලාගාර විදුලි ජනනය ඇතුලත් නොකරය. සාමාන්‍ය ව්‍යවහාරයේ NCRE (Non Conventional Renewable Energy Sources) ලෙස සලකනුයේ සුලන්, සූයර්, සුළු පරිමාණ ජල විදුලිය ආදී ප්‍රභවයන්. 2015 වසරේ මහා පරිමාණ ජල විදුලි නිෂ්පාදනය ජාතික නිෂ්පාදනයෙන් 37.5%. ජාතික ප්‍රතිපත්තියේ මේ සඳහා වූ 2015 ඉලක්කය 28%.

ඉතින් ජාතියක් ලෙස ප්‍රතිපත්තිමය වශයෙන් තිබ්බ ඉලක්කය අභිබවා ගිහින් අපි දැන් කිසිම ප්‍රතිපත්තියක් නැතුව තීරණ ගන්නවා…. ඉතින් මේ ගන්න තීරණවල අනිසි ප්‍රතිපල විඳින දවසට අපිට දෙවැනි වතාවටත් වැරදුණා නේද කියල තේරෙද්දි පරක්කු වැඩියි!

Pump Storage, Battery Storage දාන්නේ නැතුව සීමාවක් නැතුව Solar , Wind දැම්මහම අපේ ජාතික විදුලි පද්ධතියේ ස්ථාවරත්වය (Stability) එක අඩු වෙනවා..... අවුරුද්දෙන් බාගයක් විතර හුලන් නැති වෙලාවටයි …. වහින්නේ නැති කාලෙටයි.... ඉර නැති වෙලාවටයි. (මීට අමතරව විදුලි පද්ධතියේ අවස්ථිතිය (system inertia) අඩු වෙනවා…. ඒක තේරෙන්නේ විදුලි ඉංජිනේරුවන්ට විතරයි කියමුකෝ…. අනික් ටික තේරෙනවා නේ)... මේවා එකක්වත් අපිට ප්‍රශ්නයක් නැහැ.... Storage දාන්ඩ සල්ලිත් නැහැ.... හැබයි අපිට පැය 24ම දවස් 365ම අඛණ්ඩව විදුලිය දෙන්ඩ ඕනේ.....අපිට කරුවලේ ඉන්ඩත් බැහැ .... FAN AC දිගටම ගෙන ඉන්ඩත් ඕනේ හැබැයි......

අපි ඉතින් අර මුලින් කියපු වැඩේ කරලා..... ඩීසල් වලට 6 ගුණයක් ගෙවල.... ආණ්ඩුවට බැන බැන ඉමු! ඒක කොහොමත් ලේසියි!

ප. ලි - දන්න සිංහලෙන් ලිව්වා ... ඔබ සැමගේ දැනුමට/වින්දනයට ... සංවාදයට විවෘතයි!

විදුලි ඉංජිනේරු - නදීර විජේසිංහ
nadeerawije@gmail .com